**පිළිතුරු පත්‍රය ( 1 කොටස )**

**ක්‍රිස්තියානි ධර්මය, 11 ශ්‍රේණිය**

| | | | | | |
|---|---|---|---|---|---|
| 01 | 1 | දිවැස්වැකි සම්පූර්ණ වූ නිසාය. | 21 | 3 | අබ ඇටයේ උපමාව, මුහුන් පිළිබඳ උපමාව, වපුරන්නාගේ උපමාව |
| 02 | 3 | දේව කැමැත්තට අවනත විය යුතුය. | 22 | 2 | දුක්විඳීම මධ්‍යයේ උවද දෙවියන් වහන්සේට ප්‍රසංශා කර යාච්ඤා කිරීම |
| 03 | 1 | යුක්තිය උදෙසා පීඩා විඳීම | 23 | 1 | වෛරය, ඊර්ෂ්‍යාව මත් ද්‍රව්‍ය හා සුරා සූදුවෙන් වැළකී සිටීමටය |
| 04 | 2 | මහා මංගල භෝජනය, නැති වූ බැටළුවා | 24 | 1 | නිරතුරුවම දෙවියන් අයැදීම |
| 05 | 3 | මියුරියල් හවීන්ස් සොහොයුරිය | 25 | 4 | තම සුරක්ෂිතභාවය නොසැළකිය යුතුය |
| 06 | 3 | අබියාගේ පේරුව | 26 | 1 | යුගාන්තයේ ජයාන්විත භාවය සඳහා නිතර සූදානමින් සිටිය යුතු බව |
| 07 | 1 | සබත් දින අතක් පණ නැති මිනිසා සුව කිරීමෙනි | 27 | 4 | දෙවිඳුන් ඉදිරියේ ඔවුන් ප්‍රතික්ෂේප විය හැකි බව පෙන්වීම |
| 08 | 2 | B හා C ය | 28 | 1 | දෙමාපියන් හා දරුවන් සඳහා දැනුවත් කිරීමේ ව්‍යාපෘති දියත්කිරීම |
| 09 | 3 | ගෝලකමට පිවිසීමට පෙර තීරණ ගැනීමේ වැදගත්කමය | 29 | 4 | එකම එඬෙරෙක් ද එකම රැළක් ද වන්නේ ය |
| 10 | 1 | ක්‍රි.පූ. 19 | 30 | 1 | එම්මාවුස් ගමට යමින් සිටි ගෝලයන් දෙදෙනාය. |
| 11 | 3 | හාස්කම් පසුපස දුවන්නන්ටය | 31 | 1 | දකුණු අප්‍රිකාවේ කළු සුදු භේදය අතර සාමයට ක්‍රියා කිරීම නිසාය |
| 12 | 3 | සේවා වෙලාව තුළ සියළුදෙනාගේ සිත් දිනාගෙන ඵලදායි සේවයක් කළ යුතුය. | 32 | 2 | මිත්‍යා මතවලින් වැළකී එකම දෙවිඳුන් නැමදීමයි. |
| 13 | 1 | දෙවියන් වහන්සේගේ බලවත් ක්‍රියා පිළිබඳ අතීත අත්දැකීම් සිහිපත් කිරීමයි | 33 | 2 | සාමයෙන් සහෝදරත්වයෙන් ක්‍රියා කළ යුතුය |
| 14 | 3 | නීතිය පදනම් වී ඇත්තේ මිනිසාට ඇති ප්‍රේමය සහ දයානුකම්පාව මතය | 34 | 2 | '' දිළිඳුන් ද අබ්බගාතයන් ද සොරුන්ද කැඳවන්න '' |
| 15 | 1 | ඔබේ ඉඟ පටිය බැඳ පහන් දල්වා තබා ගන්න. | 35 | 1 | පරිසියෙක්වීම, රෝම පුරවැසි භාවය හා කූඩාරම් සෑදීමේ කර්මාන්තය. |
| 16 | 1 | සමාරිත ස්ත්‍රීය සමඟ ජේසුස් වහන්සේ පැවැත්වූ සංවාදයය | 36 | 3 | ජේසුස් වහන්සේගේ සේවයේ පංගුකාරයන් විය යුතු බවය |
| 17 | 1 | මා පියන් නොසලකන දරුවන් ඔවුන් මිය ගිය පසු ස්මාරක තනන විටය | 37 | 2 | අන්‍යජාතීන්ට ද දේව රාජ්‍යය විවෘතය |
| 18 | 4 | ඇදහිල්ලෙන් සාක්ෂි දැරිය යුතුය. | 38 | 2 | එක් නුවරක සිටි කුෂ්ඨයෙන් පිරුණු මිනිසාට සුවය දුන් අවස්ථාව |
| 19 | 3 | කන්දක් මත රූප විපර්යාසය අත්දුටු විටය | 39 | 2 | A හා C ය |
| 20 | 2 | මන්ත්‍රණ සභාවෙන් අවසර නොලැබුවද දේශනා කළ අවස්ථාවයි | 40 | 1 | සියලු බාධක අභිබවමින් දේව ප්‍රේමය සමාජය තුළ පතළ කළ යුතුය |

# ක්‍රිස්තියානි ධර්මය

## පිළිතුරු පත්‍රය

## II කොටස

01). i. වහල්කමින් මිදී මිසර දේශයෙන් පිටවූ රාත්‍රියේදී ඉශ්‍රායෙල් ජනතාවගේ කුළුදුල් පිරිමි දරුවන් විනාශ නොවීම සිහි කරනු සඳහා මේ ලෙස චාරිත්‍රයක් ලෙස කිරීම.

ii. (a) රෝම ශතාධිපතියාගේ විශ්වාසය පිළිබඳවය.

(b) පූර්ණ ඇදහිල්ල, විශ්වාසය, නිහතමානිකම ඔහුගේ ඉල්ලීම සාර්ථක වූ ලෙස අපටත් එම ගුණාංග මඟින් බලාපොරොත්තු ඉටු කරගැනීමට මඟ පෙන්වීම.

iii. " වෙද තුමාණෙනි, ඔබ ඔබම සුව කරගන්න "

"ගමේ දිවැසිවරයා ගමට අගේ නැත "

iv. දාවිත් රජ පරපුරින් පැමිණෙන මෙසියස් වහන්සේ

මෙසියස් වහන්සේගේ රාජ්‍ය සදාකාලික බව

v. ගරු පීටර් පෙරාඩ්ද සිල්වා දේව ගැති තුමා

දෙවන ජුවාම් පාවුළු වහන්සේ

vi. සැබෑ මිදිවැල - ජේසුස් වහන්සේ සමඟ සම්බන්ධ වීමේ වැදගත්කම නිසි ඵල දැරීමට සම්බන්ධවීම අවශ්‍ය බව එසේ නොවී නම් ඵල දරන අයට දේව රාජ්‍ය තැනක් අහිමි වන බව

vii. යායිරස්ගේ දියණිය මරණයෙන් උත්ථාන කිරීම.

කායින් නුවර වැන්දඹුවකගේ පුත්‍රයා මරණයෙන් උත්ථාන කිරීම.

ලාසරස් මරණයෙන් උත්ථාන කිරීම.

viii. නායකත්වය දැරුවේ - ජාකොබ්

අන්‍ය ජාතින්ගෙන් ලැබූ වරම - චර්ම ඡේදන චාරිත්‍රය නොමැතිව සහභාගී වීම.

ix. ලුස්ත්‍රාව

x. කාන්තා සංවිධානය - තරුණ කාන්තා ක්‍රිස්තියානි සංගමය - (YMCA)

පුරුෂ සංවිධානය - තරුණ ක්‍රිස්තියානි සංගමය - (YMCA)

02). i. අඟහිඟ නැත/දම්ටු මඟ ගෙනයාම/බියක් සැකයක් නැත/ආරක්ෂාව/සතුරන්ගෙන් ගැළවීම/දයාව හා කරුණාව දිවිහිමියෙන්ම / පෝෂණය / ආශිර්වාදය
(මින් ලක්ෂණ දෙකක් සෑහේ)

ii. හඬට සවන් දීම/ හඬ හඳුනා ගැනීම/විශ්වාසවන්තව හා කීකරු වී / පසුපස යාම/ යහපත් එඬේරා හඳුනා ගැනීම / එඬේරාට අවනත නොවීම නිසා සිදුවන අනතුරු හඳුනා ගැනීම.

iii. පෝෂණය - (පන්දහසකට කෑම දීම) / අවශ්‍යතා ඇති අයට පිහිට වීම / ආහාර දීම

සොයා යාම - (නැතිවූ බැටළුවා) වැරදි මඟ ගිය අයව සොයා ගොස් යහමඟට ගැනීම.

සතුරන්ගෙන් ගැළවීම - (පීඩිතයන් මුදාලීම) විවිධ සමාජ තහංචි වලට එරෙහිව හඬක් නැගීම.

රෝගින්ට සුවය - (ලාදුරු රෝගින්ට) රෝගීන්ට උපස්ථාන කිරිම / ඔවුන් වෙනුවෙන් දෙවිදුන් යැදීම.

අසීමිත ප්‍රේමය - (අකීකරු පුත්‍රයා) ප්‍රේමය දැක්වීම.

සැවොම පිළිගැනීම - (පව්කාර ස්ත්‍රිය / සාකෙවුස්) ජාති භේද නොතකා බහුවිධ සමාජය තුළ සැමදෙනා සමඟ සහජීවනයෙන් හා ප්‍රේමයෙන් දිවි ගෙවීම.

03). i. යහපත් ගුණ ධර්ම ක්‍රියා කරන අය අතර දේව රාජ්‍යයේ පැවැත්ම ඇති බව එයට සීමා නැත. දෙවියන් වහන්සේ රජ කරන අතර සැමට විවෘතය. රාජ්‍ය සදාකාලිකය.

ii. පුරවැසියන් ලෙස තිබිය යුතු ගුණාංග

අන් අය උදෙසා සෑම බාධක ඉවතලා වැය වීම.

සේවක නායකත්වය එනම් නිහතමානීව නිතර ක්‍රියා කිරිම.

තම තලෙන්න භාවිතා කරමින් දේවරාජ්‍යයේ වැඩි වර්ධනයට ක්‍රියා කිරීම.

නිරතුරුව ස්ථානෝචිත ප්‍රඥාවෙන් ක්‍රියා කිරීම.

iii. නායක තනතුරක් ලැබුවහොත් අන් අය උදෙසා කැපවීම.

සමාජයේ සැමට එක ලෙස පිළිගනිමින් උදව්වීමට යොමු වීම.

හැකියා උපරිම මට්ටමින් ප්‍රයෝජනයට ගෙන දේව රාජ්‍යයේ අගයන් අනුව ජීවත් වීම.

ජාති කුලභේද නොතකා මෙම බහුවිධ සමාජයේ සියලු දෙනා උදෙසා ක්‍රියා කිරීම.

වෙසෙන පරිසරය අනුව ස්ථානෝචිත ප්‍රඥාවෙන් ක්‍රියා කිරීම.

04). i. හිංසනයට, පීඩනයට ලක්ව සිටි ජන කොටස්, කාන්තාවන්, දුගී අය, රෝගීන් (මානසික) දුෂ්ට ආත්මවලින් පෙළුන අය, පව්කරුවන්.

ii. රෝගීන් සුවකර සමාජයට ගැනිම.

පව්කරුවන්ට සමාව දීමෙන් නව මඟකට යොමු කිරීම.

ප්‍රතික්ෂේපයට ලක්ව සිටි සමාරිතයන් වැනි පිරිස් පිළිගැනීම

කාන්තාවන් පවා ගෝල පිරිසට එක්කර ගැනීම හා දේව රාජ්‍යයේ වර්ධනයට සහභාගී වීම.

iii. ස්වභාවික ව්‍යවසනයන් - සරණාගත කඳවුරු වල පසුවන අය ඔවුනට මානසික සුවය ලබා දී යළි ජීවිත ගොඩ නගා ගැනීමට සහය ලබාදීම.

ස්ත්‍රී දූෂණය - ස්ත්‍රීන් හා පුරුෂයන් යන දෙපක්ෂයට දැනුවත් කිරීමේ ව්‍යාපෘතිවල යෙදීම.

ළමා අපයෝජනය - දරුවන් රැකගැනීමට නිසි අවවාද හා ප්‍රචාරක කටයුතු දියත් කිරිම.

වතුකරයේ ජනයා / කම්හල්වල සේවක සේවිකාවන් - ඔවුන්ට නිසි වැටුප් හා පහසුකම් සපයා දීමට ඔවුන් වෙනුවෙන් හඬක් නැගීම.

ආර්ථික වශයෙන් රැකියා නොමැතිව - දුගී බවට පත් වී සිටින අය

ඔවුන්ගේ ආර්ථික තත්ත්වය නඟාලීමට තම දේවස්ථානය හෝ එබඳු සංගම් මගින් දායක වීම.

05). i. පාවුල්, සීලස්, තිමෝතියස්, ලූක්

ii. තොරතුරු 11 ශ්‍රේණියේ 59, 60, 62 පිටුවල පිළිතුරු ඇත. ඉන් කරුණු 03 ක් ලිවීම ප්‍රමාණවත්

iii. විවිධ අභියෝග ජයගනිමින්, ශුද්ධාත්ම දිරිය හා සවිය තුළ ස්ථානෝචිත ප්‍රඥාවෙන් පාවුල්, සීලස්, තිමෝතියස් හා ලූක් ලද අභියෝගයන් මෙන් ඔබ ලබන අභියෝගයන් 05 ක් නම් කර එම අභියෝග ජයගන්නා අයුරු ඒ සඳහා ක්‍රියාකරන ආකාරය ලියා තිබීම තුළ කරුණු 05 කට ලකුණු පවරන්න.

06). i. මුල් කිතුණු සභාවේ උතුම් වටිනාකම් - එක්සිත්ව එක්සත්ව සහෝදර ප්‍රේමයෙන් ක්‍රියා කිරිම, දේව වචනය ප්‍රකාශ කිරීම සියල්ල පොදුවේ තබා ගැනීම, රොටී කැඩීම, දිනපතා රැස්වීම අවශ්‍යතා ඇති අයට සහනාධාර ලබාදීම, දිනපතා යාච්ඤාවේ යෙදීම.

ii. සියල්ල පොදුවේ තබා ගනිමින් නැති බැරි අය සඳහා යොමු වීම.

ගෙයින් ගෙයට ගොස් රැස්වීම් පැවැත්වීම නිසා ඕනෑ එපාකම් ගැන අවබෝධ කරගැනීම.

දියාකෝන්වරු/ තේවාචාරීන් 7 දෙනෙකු පත්කර සහනාධාර දීමේ වැඩ කටයුතු වල නිරත වීම.

වෙනත් ජාතීන් සම්බන්ධයෙන් නිසි පිළියම් සෙවීම හා එකඟතාවයකට පැමිණීම.

iii. නමස්කාර ජීවිතය ආදර්ශයට ගනිමින් - දිනපතා උදෑසන හා සවස යාච්ඤා හා බයිබල් අධ්‍යාපන කටයුතු වල යෙදීම, දේවස්ථාන පිරිස සමඟ දේව ප්‍රශංසාවට යොමු වෙමින් රොටී කැඩීමේ සමූහ නමස්කාර වත් පිළිවෙත් අනුගමනය කිරීම.

ධර්මදාන මෙහෙවර අනුව - ශුභාරංචි ප්‍රකාශ කිරීමේ වැඩපිළිවෙල දියත් කිරීම, කිතුනු දරුවකු ලෙස ආදර්ශමත්ව ජීවත් වීම, රෝගාතුර අය උදෙසා යාච්ඤා පැවැත්වීම, දහම් පාසල් පවත්වාගෙන යාම, ආරෝග්‍යශාලා වල දයාවේ සේවයන්ට යොමුවීම, ලකුණු මගින් විශ්වාසය හා ඇදහිල්ල සභාව තුළ වර්ධනය කිරීමට වැඩ පිළිවෙල යොදා ගැනීම.

ශුභ සාධන කටයුතු ව්‍යාප්ත කිරිම - සභාව හෝ දේවස්ථානය අවට ඇති අවශ්‍යතා සලකා බලා ඒ සඳහා සංවිධානය වී ස්වේච්ඡාවෙන් සේවය කිරීම, ජාති ආගම් භේදයෙන් තොරව පැල්පත් වාසීන්ගේ අවශ්‍යතා සපුරාලීමට අතහිත දීම, සභා සතු වත්කම් හැකි පමණ බෙදා ගනිමින් අන් අය උදෙසා ක්‍රියා කිරීම.

07). i. කිතුනු එක්සත්කම - විවිධත්වය තුළ ඒකත්වය ජේසුස් වහන්සේ හිසවන අතර අපි විවිධ අවයවයන් ලෙස බැඳී සිටිමු. ජේසුස් වහන්සේගේ උත්තම පූජක යාච්ඤාවෙන් එතුමා දෙවියන් වහන්සේ සමග එක්සත් වන්නා සේ සියලු ඇදහිලිවලිවන්තයින් සම්බන්ධවීමේ අවශ්‍යතාවය එක්සත්කමේ සංකේතය ලෙස බෞතීස්ම පිළිගැනීම, කිතුනු එක්සත්කම උදෙසා පිහිටුවා ඇති සංවිධාන ජා.ක්‍රි.ම. ලෝක කිතුනු සංවිධාන, තරුණ ක්‍රිස්තියානි සංවිධානය ආදිය.

ii. මුල් කිතුනු සභාවේ විශේෂිත ලක්ෂණ - සාමූහික්තවය, බෙදා ගැනීම, යාච්ඤාව, අන් අයගේ අවශ්‍යතා ගැන සැලකිලිමත් වීම, දේව වචනය හැදෑරීම, රොටී කැඩීමෙන් සහෝදරත්වය හා සහයෝගීත්වය, සාමානාත්මතාවයෙන් සියලු දෙනා පිළිගැනීම, සාකච්ඡාවෙන් විසඳුම් සෙවීම, ශුද්ධාත්ම මඟ පෙන්වීමට විවෘත වන රැස්වීම් පැවැත්වීම. (යනාදී තවත් කරුණුය)

iii. ආගන්තුක සතකාරය - යුදෙව් සමාජයේ මෙය විශේෂ ලක්ෂණයක් විය. උදා - ආබ්‍රහම්, මාර්තා, මරියාගේ නිවසේ පැවැති ආගන්තුක සත්කාරය, පාවුල් සිරකරුවෙකු ලෙස මෝල්ටාවේදී ලැබූ ආගන්තුක සත්කාරය, කිතුනු අපගෙන් බලාපොරොත්තු වන්නේ අප නොදන්නා වූ දුගී අය සඳහා වැඩි සැලකිල්ල දැක්වීමය. උත්සව සඳහා එබඳු අයට ආරාධනා කිරිම, සත්කාර කිරිම, තමාට ආරාධනා ලැබූ විට පසුව ආසන ගැනීම.

iv. සාමය උදෙසා කැපවීම - ජේසුස් වහන්සේ සාමකුමරා වීම, උන්වහන්සේ මෙලොව වැඩීමේදී දේව දූත පණිවිඩය වූයේ දෙවිඳුන්ට මහිමය හා දේව ප්‍රසාදය ජනතාව අතර, සාමය වේවා කියාය. මීක්ෂා මීකා දිවැසිවරයා රඟ දක්වා ඇත්තේ ද ජේසුස් වහන්සේගේ පැමිණීමෙන් යුද්ධය වෙනුවට සාමය ස්ථාපිත කරන බවය. සාමය ඇති කරන්නෙත් දෙවියන් වහන්සේ ගේ දූ දරුවන් ලෙස ජේසුස් වහන්සේගේ පැවසීම, තම නිවස, පාසල, සමාජය තුළ භේද අර්බුද මධ්‍යයේ සාමය ගෙන ඒමට මැදහත්ව කටයුතු කිරීමට අපේක්ෂිතය. (සිසුන් ලියා ඇති පිළිතුරු අමුණා ලකුණු ලබා දෙන්න.)